වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# පුරප්පාඩු

## පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. වැඩ අධිකාරී (සිවිල්) තනතුර - පුරප්පාඩු 01

- **සුදුසුකම්**

  - **බාහිර :**

    ජාතික තාක්ෂණ (සිවිල්) ඩිප්ලෝමාව **හෝ** ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES)

    **සහ**

    රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හයක (6) පශ්චාත් පළපුරුද්ද

    **සටහන :** කාර්මික (මෝටර් රථ) හා විදුලි බල නඩත්තු කටයුතු හැසිරවීම පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

  - **අභ්‍යන්තර**

    කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ තාක්ෂණික නිලධාරී (සිවිල්) තනතුරෙහි I ශ්‍රේණියේ වසර පහක (5) පළපුරුද්ද.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : කනිෂ්ඨ කළමනාකරණ සේවය (JM 1-2)

- **වැටුප් පරිමාණය** : රු. 74,010 – 10x1,360 – 18x2,040 – 124,330

- **ආරම්භක වැටුප් තලය** : රු. 74,010.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 66,781.00කි.

## 02. මානව සම්පත් නිලධාරී තනතුර - පුරප්පාඩු 01

- **සුදුසුකම්**

  - **බාහිර :**

    පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධිය සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසරක (1) පශ්චාත් පළපුරුද්ද

  - **අභ්‍යන්තර**

    මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා කාණ්ඩයේ අවම වශයෙන් වසර පහළොවක (15) ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

    **හෝ**

    කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා කාණ්ඩයේ I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : කනිෂ්ඨ කළමනාකරණ සේවය (JM 1-2)

- **වැටුප් පරිමාණය** : රු. 74,010 – 10x1,360 – 18x2,040 – 124,330

- **ආරම්භක වැටුප් තලය** : රු. 74,010.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 66,781.00කි.

## 03. පුස්තකාලයාධිපති තනතුර - පුරප්පාඩු 01

- **සුදුසුකම්**

  - **බාහිර**

    පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පුස්තකාල විද්‍යාව පිළිබඳ උපාධිය සහ අවම වශයෙන් වසරක (1) පශ්චාත් පළපුරුද්ද

    **හෝ**

    පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් (ජීව විද්‍යාව පිළිබඳ උපාධිය වඩාත් යෝග්‍ය වේ) සමඟ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ අවසන් විභාගය සහ අවම වශයෙන් වසරක (1) පශ්චාත් පළපුරුද්ද.

    **සටහන :** විද්‍යාත්මක පොත්/ සඟරා වර්ගීකරණය, නාමාවලිගතකරණය, සුචිගතකරණය හා සාරාංශගතකරණය සහ පරිගණකගත පුස්තකාල යෙදවුම් භාවිතය පිළිබඳ පළපුරුද්ද හෝ විශේෂ කුසලතා අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

➢ **අභ්‍යන්තර**

පුස්තකාල විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව සහ කළමනාකරණ සහකාර තාක්ෂණික හෝ තාක්ෂණික නොවන සේවා කාණ්ඩයක අවම වශයෙන් වසර පහළොවක (15) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**හෝ**

කළමනාකරණ සහකාර තාක්ෂණික හෝ තාක්ෂණික නොවන සේවා කාණ්ඩයක I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : කනිෂ්ඨ කළමනාකරණ සේවය (JM 1-2)

- **වැටුප් පරිමාණය** : රු. 74,010 – 10x1,360 – 18x2,040 – 124,330

- **ආරම්භක වැටුප් තලය** : රු. 74,010.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 66,781.00කි.

## 04. වතු අධිකාරි තනතුර - පුරප්පාඩු 02

- **සුදුසුකම් :**

➢ **බාහිර :**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධිය සමඟ හෙක්ටයාර 50 කට වැඩි වත්තක් කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසරක (1) පශ්චාත් පළපුරුද්ද.

**සටහන** : පොල් වතු කළමනාකරණය හා කම්කරු කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

➢ **අභ්‍යන්තර :**

උපාධිය සමග සහකාර වතු අධිකාරිවරයෙකු ලෙස වසර පහක (5) සතුටුදායක අදාළ පළපුරුද්ද.

**හෝ**

කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ ක්ෂේත්‍ර නිලධාරී තනතුරෙහි I ශ්‍රේණියේ වසර පහක (5) ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : කනිෂ්ඨ කළමනාකරණ සේවය (JM 1-2)

- **වැටුප් පරිමාණය** : රු. 74,010 – 10x1,360 – 18x2,040 – 124,330

- **ආරම්භක වැටුප් තලය** : රු. 74,010.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 66,781.00කි.

## 05. සහකාර බීජ හා බීජ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන හා සහතික කිරීමේ නිලධාරි තනතුර - පුරප්පාඩු 01

- **සුදුසුකම් :**

  - **බාහිර**

    පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය හෝ ජීව විද්‍යාව පිළිබඳ උපාධිය.

  - **අභ්‍යන්තර**

    කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ තාක්ෂණ නිලධාරී තනතුරෙහි වසර දහයක (10) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

  **සටහන** : පොල් තවාන් කළමනාකරණය හෝ මව් ශාක තේරීම පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් සේ සළකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ක්‍රියාත්මක කිරීමේ/ උපදේශන සේවය (MA 4)

- **වැටුප් පරිමාණය** : රු. 64,320 – 10x1,360 – 15x1,670 – 5x2,040 – 113,170

- **ආරම්භක වැටුප් තලය** : රු. 64,320.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 58,598.00කි.

## 06. පර්යේෂණාත්මක නිලධාරි තනතුර - පුරප්පාඩු 02

- **සුදුසුකම්:**

  - **බාහිර**

    පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විද්‍යාව/ කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධිය

  - **අභ්‍යන්තර**

    කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ තාක්ෂණ නිලධාරී තනතුරෙහි වසර දහයක (10) සතුටුදායක සේවයක් සපුරා තිබීම

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ක්‍රියාත්මක කිරීමේ/ උපදේශන සේවය (MA 4)

- **වැටුප් පරිමාණය** : රු. 64,320 – 10x1,360 – 15x1,670 – 5x2,040 – 113,170

- **ආරම්භක වැටුප් තලය** : රු. 64,320.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 58,598.00කි.

## 07. පර්යේෂණාත්මක නිලධාරි (දෙමළ මාධ්‍ය) තනතුර - පුරප්පාඩු 01

- **සුදුසුකම්:**

  - **බාහිර**

    පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විද්‍යාව/ කෘෂිකර්මය/ වැව්ලි කළමනාකරණය පිළිබඳ උපාධිය

  - **අභ්‍යන්තර**

    කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ තාක්ෂණ නිලධාරී තනතුරෙහි වසර දහයක (10) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සටහන :** වලංගු යතුරු පැදි බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

**භාෂා ප්‍රවීණතාවය :**
අයදුම්කරුවන් දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා හැසිරවීමේ ප්‍රවීණතාවයක් ලබා තිබිය යුතු අතර, දෙමළ භාෂා පරිගණක යතුරු පුවරුව භාවිතා කිරීමේ හැකියාව සතු විය යුතුය. සිංහල භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් වේ.

- **වගකීම් :**
  තාක්ෂණ හුවමාරු අංශයේ අංශ ප්‍රධානීගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් වගකීම් දැරිය යුතුය.
  i. ඉංග්‍රීසි/ සිංහල මාධ්‍ය ලිපිලේඛන දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.
  ii. විශේෂයෙන් දෙමළ භාෂාව කථා කරන ප්‍රදේශවල තාක්ෂණ හුවමාරු කටයුතු සිදු කිරීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ක්‍රියාත්මක කිරීමේ/ උපදේශන සේවය (MA 4)

- **වැටුප් පරිමාණය** : රු. 64,320 – 10x1,360 – 15x1,670 – 5x2,040 – 113,170

- **ආරම්භක වැටුප් තලය** : රු. 64,320.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 58,598.00කි.

## 08. සහකාර වතු අධිකාරි තනතුර - පුරප්පාඩු 03

- **සුදුසුකම් :**

  - **බාහිර**

    පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධිය

    **සටහන :** පොල් වතු කළමනාකරණය හා කම්කරු කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

  - **අභ්‍යන්තර**

    අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු (2) ඩිප්ලෝමාව සමග කළමනාකරණ සහකාර සේවා කාණ්ඩයේ ක්ෂේත්‍ර නිලධාරි තනතුරෙහි II ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ආශ්‍රිත නිලධාරී සේවය (MA 3)

- **වැටුප් පරිමාණය** : රු. 53,940–10x800–11x1,190–10x1,320–5x1,350–94,980

- **ආරම්භක වැටුප් තලය** : රු. 53,940.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 49,831.00කි.

## 09. තාක්ෂණ නිලධාරී තනතුර - පුරප්පාඩු 03

- **සුදුසුකම්:**

  - **බාහිර**

    අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සමග අවම වශයෙන් එකවර විෂයයන් හයකින් (6) සමත් වී තිබීම

    **සහ**

    අ.පො.ස (උසස් පෙළ) විද්‍යා අංශයෙන් අදාළ විෂයය සංයුතිය සමග එකවර විෂයන් තුනකින් (3) සමත් වීම හා පිළිගත් ආයතනයකින් ලබාගත්, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු දෑ අවුරුදු (2) ඩිප්ලෝමාව.

  - **අභ්‍යන්තර**

    අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සමග අවම වශයෙන් එකවර විෂයන් හයකින් (6) සමත් වී තිබීම හා පිළිගත් ආයතනයකින් ලබා ගත්, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමාව සහ ප්‍රාථමික සේවා කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **රැකියා අවශ්‍යතාවන්** :
  - ✓ තෝරා ගන්නා අයදුම්කරුවන් රසායනාගාරවල මෙන්ම ක්ෂේත්‍රයේ ද රාජකාරි කටයුතු සිදු කළ යුතු ය.
  - ✓ යතුරුපැදි පැදවීමේ වලංගු බලපත්‍රයක් හිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවය (MA 2-2)

- **වැටුප් පරිමාණය** : රු. 50,540-10x540-7x630-4x1,080-20x1,280-90,270

- **ආරම්භක වැටුප් තලය** : රු. 50,540.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 46,960.00කි.

## 10. ක්ෂේත්‍ර නිලධාරි තනතුර - පුරප්පාඩු 02

- **සුදුසුකම් :**

  - ➢ **බාහිර**

    තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රයේ (කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු **[**අවම වශයෙන් වසර දෙකක (2)**]** ප්‍රවීණතා සහතිකය

  - ➢ **අභ්‍යන්තර**

    ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම්.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 22 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවය (MA 2-2)

- **වැටුප් පරිමාණය** : රු. 50,540-10x540-7x630-4x1,080-20x1,280-90,270

- **ආරම්භක වැටුප් තලය** : රු. 50,540.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 46,960.00කි.

## 11. රසායනාගාර හා ක්ෂේත්‍ර සහකාර තනතුර - පුරප්පාඩු 06

- **සුදුසුකම් :**

  - **බාහිර**

    අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල/ දෙමළ), ඉංග්‍රීසි හා විද්‍යාව/ කෘෂිකර්මය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සමග එකවර අවම වශයෙන් විෂයයන් හයකින් (6) සමත් වීම සහ අ.පො.ස (උසස් පෙළ) විද්‍යා අංශයෙන් එකවර විෂයයන් තුනකින් (3) සමත්වීම.

    **සටහන** : රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක රසායනාගාරයක සේවය කිරීමේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

  - **අභ්‍යන්තර**

    පහත සඳහන් සුදුසුකම් සහිත ප්‍රාථමික මට්ටමේ ශිල්පීය (PL 3), ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය (PL 2), ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන (PL 1) සේවකයින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

    අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල/ දෙමළ), ඉංග්‍රීසි හා විද්‍යාව/ කෘෂිකර්මය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සමග අවම වශයෙන් එකවර විෂයන් හයකින් (6) සමත් වී තිබීම

    **සහ**

    ඉහත සඳහන් සේවා කාණ්ඩයේ ස්ථිර සේවයේ අවම වශයෙන් වසර පහක (5) සේවය.

- **රැකියා අවශ්‍යතාවන්** :
  - ✓ දුර බැහැර ප්‍රදේශවල පිහිටි පොල් ඉඩම්වල ද ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සිදු කළ යුතු ය.
  - ✓ යතුරුපැදි පැදවීමේ වලංගු බලපත්‍රක් හිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස වසර 18 ට නොඅඩු විය යුතු අතර වසර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **සේවා කාණ්ඩය** : කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවය (MA 1-2)

- **වැටුප් පරිමාණය** : රු. 46,220-10x540-7x630-12x1,080-12x1x280-84,350

- **ආරම්භක වැටුප් තලය** : රු. 46,220.00
  කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව මෙම මූලික වැටුප 2027.01.01 දින සිට හිමි වන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2026.01.01 දිනට ගෙවනු ලබන මුදල රු. 43,312.00කි.

<u>**පොදු කොන්දේසි**</u>

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි.
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් අත්සන් කරන ලද තම අයදුම්පත 2026.03.27** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල, 61150** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකි ය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

අදාළ සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය වන **www.cri.gov.lk** හි ද පළ කර ඇත.

සභාපති
පොල් පර්යේෂණ මණ්ඩලය
ලුණුවිල